සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமானக் கொள்கை, நிர்வாகம்)
Additional Commissioner General (Revenue Policy & Admin)
2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර. රාජගිරිය. இல.353,கோட்டை வீதி.இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல:<br>My No. | ED/03/05/02/51 | ඔබේ අංකය.<br>உமது இல:<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.08.31 |

සියලුම බලපත්‍රධාරීන් වෙත,

<u>සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ගෙවීම් පත්‍රිකාවක් හඳුන්වා දීම.</u>

සුරාබදු දෙපාර්තමේන්තුවෙන් සේවය සපයා ගැනීමට පැමිණෙන බලපත්‍ර හිමියන්ගේ පහසුව වෙනුවෙන් හා දෙපාර්තමේන්තු බැංකු ගිණුම් සඳහා බලපත්‍ර හිමියන් ,විවිධ ආයතන හා පුද්ගලයින් විසින් ලංකාවේ විවිධ ප්‍රදේශ වල පිහිටි බැංකු ශාඛා වලින් තැන්පතු කරනු ලබන මුදල් හා චෙක්පත් පහසුවෙන් හඳුනා ගැනීමත් අදාල ගෙවීම් සෘජු ව බැංකුව වෙත යොමු කිරීමට පහසුකම් සලසා දීමත් මෙහි අරමුණයි.

ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන බදු මුදල් හා ප්‍රමාද ගාස්තු , ගෙවූ ආයතනය හෝ පුද්ගලයින් හඳුනා ගැනීමත් ඊට අමතරව ගෙවනු ලැබූ මුදල කුමන ආදායම් කේතයක් සඳහා ගෙව්වේද යන්නත් පහසුවෙන් හඳුනා ගැනීමත්, ආදායම් කේතයන් දෙපාර්තමේන්තු බැංකු ප්‍රකාශයේ මුද්‍රණය කර ගැනීමත්, බදු ගෙවන්නන් සඳහා පහසුව සැලසීමත් අපේක්ෂාව වේ.

2022 සැප්තැම්බර් මස 01 වන දින සිට මෙම ක්‍රමය ක්‍රියාත්මක වන අතර ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු වේ.

01.මෙම තැන්පතු පත්‍රිකාව පිටපත් 03 කින් යුක්ත වන අතර පලමු පිටපත බැංකු පිටපත වන අතර, දෙවන පිටපත බදු ගෙවන්නාගේ පිටපත හා තෙවන පිටපත සුරාබදු දෙපාර්තමේන්තු පිටපත වේ. පලමු පිටපත බැංකුව වෙත තබා ගන්නා අතර දෙවන පිටපත හා තෙවන පිටපත ඔබ විසින් ලබා ගෙන එම තෙවන පිටපත සුරාබදු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

02.ඔබ විසින් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත සිදු කරනු ලබන සියළුම ගෙවීම් ඔබ වෙත ලබා දෙනු ලබන තැන්පතු පත්‍රිකාව මඟින් පමණක් සිදු කළ යුතුය.(මෙය මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් කරන්නන් සඳහා අදාල නොවේ) මෙම තැන්පතු පත්‍රිකාව සුරාබදු මූලස්ථානයේ ගිණුම් අංශය හා ඔබට අදාල සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල මඟින් ලබා ගත හැක.

තැන්පතු පත්‍රිකාවේ පිටුපස උපදෙස් තීරුවෙහි දක්වා ඇත්තේ ආදායම් සංකේත කිහිපයක් පමණි. සියළුම ආදායම් කේතයන් ඔබ වෙත ලබා දෙන ඇමුණුමෙහි දක්වා ඇති අතර, ඒ අනුව ආදායම් කේතය නිවැරදිව සටහන් කරන ලෙස කාරුණිකව දන්වමි.

03.තැන්පතු පත්‍රිකාව (Deposit Slip) සම්පූර්ණ කිරීමේදී ඔබට ලබා දී ඇති <u>අංක 09 කින් යුත් සුරාබදු බලපත්‍ර අංකය (ඇමුණුම 01) හා අංක 02 කින් යුත් ආදායම් කේතය (ඇමුණුම 02) ඉතා නිවැරදි ව සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ</u>. ගෙවීම් කාලය සඳහන් කිරීමේදී පහත පරිදි කටයුතු කරන්න.

ගෙවීම් කාලය අංක 05 කින් යුක්ත වේ.

- පලමු අංක 2 -වර්ෂය
- ඊ ලඟ අංක 2-මාසය
- අවසාන අංක 1-බදු කාල සීමාව-එනම් දින 01-15 බදු කාල සීමාව සඳහා **1** ද,

  -දින 16-31 බදු කාල සීමාව සඳහා **2** ද,

  -ඉහත 1,2 ට අදාල නොවන වෙනත් කාල සීමාවන් සඳහා **0** ලෙස ද

උදා- 2022 ඔක්තෝබර් 16-31 බදු කාල සීමාව සඳහා ගෙවීම් කාලය **22102 ලෙස විය යුතුය.**

| **වර්ෂය** | | **මාසය** | | **බදු කාල සීමාව** |
|---|---|---|---|---|
| **2** | **2** | **1** | **0** | **2** |

*** යොමු අංකය හා ගෙවීම් වවුචර් අංකය ඔබ වෙත ලබා දී ඇතිනම් පමණක් ඇතුලත් කරන්න.**

*** <u>බද්ද</u> යන ස්ථානයේ බද්ද හා ප්‍රමාද ගාස්තු නොවන, ආදායම් කේත ලැයිස්තුවේ සඳහන් වෙනත් ගෙවීම් ද සටහන් කළ හැකිය.**

04.මෙම තැන්පතු පත්‍රිකාව මඟින් ගෙවීම් කිරීමේදී මුදල් ගෙවීම් සිදු කළ හැකිඅතර, මාර්ගගත ක්‍රමය (Online Payments) යටතේ සිදු කරනු ලබන ගෙවීම් ඒ ආකාරයෙන් ම ඉදිරියටත් සිදු කිරිමට මෙය බාධාවක් නොවන බව ද දන්වා සිටිමි. <u>**මුදල් තැන්පත් කිරිමේ යන්ත්‍ර (CDM) මඟින් මුදල් තැන්පත් කිරිම සිදු නොකල යුතුය.**</u>

මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය කෘතවේදී ව අගය කරන අතර වැඩිදුර විමසීම් දුරකථන අංක 011-2045073 හා 011-2045097 මඟින් ලබා ගත හැක. ඔබට ලබා දී ඇති අංක 09 කින් යුත් සුරාබදු බලපත්‍ර අංක ලැයිස්තුව හා අංක 02 කින් යුත් ආදායම් කේත ලැයිස්තුව දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ඇතුලත් කර ඇත.

එම්.ජේ.ගුණසිරි

සුරාබදු කොමසාරිස් ජනරාල්.

පිටපත- සහකාර සුරාබදු කොමසාරිස්වරු- කා.දැ. හා අ.ක. සඳහා